# AGREEMENT

# BETWEEN

# THE GOVERNMENT OF THE KINGDOM OF CAMBODIA

# AND

# THE GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

# ON

# THE EXEMPTION OF VISA REQUIREMENTS FOR HOLDERS OF DIPLOMATIC AND SERVICE / OFFICIAL PASSPORTS

The Government of the Kingdom of Cambodia and the Government of the Democratic Socialist Republic of Sri Lanka (hereinafter referred to as the "Parties");

Desiring to strengthen the bonds of friendship and cooperation between the two countries;

Recognizing the need to facilitate travels into each other's territory by citizens of both countries;

Have agreed as follows:

## ARTICLE 1

1- Citizens of either Party holding diplomatic and service / official passports, shall enter, transit through, stay and leave the territory of the State of the other Party, without a visa, for a period of thirty (30) days from the date of entry.

2- Citizens of either Party referred to in Article 1 of this Agreement, who intend to stay longer than thirty (30) days in the territory of the other Contracting Party, shall go through necessary registration procedures, in accordance with the relevant regulations of the latter's competent authorities.

## ARTICLE 2

In case there is no Diplomatic Mission or Consular Post of the Parties, holders of diplomatic or service / official passports shall address to the Consular Department of the Ministry of Foreign Affairs of the host country.

## ARTICLE 3

The Nationals of each Party assigned as members of the diplomatic or consular post accredited to the country of the other Party, who are in possession

of valid diplomatic passports shall not be entitled to enter in terms of Article 1 of this Agreement. Such officers along with their families shall be required in accordance with the relevant laws and regulations of the Parties to obtain appropriate visa from the Embassy of the other Party.

## ARTICLE 4

Citizens mentioned in this Agreement may enter, transit through and leave the territory of the State of the other Party through all border crossing points open to international passenger traffic.

## ARTICLE 5

Citizens of either Party shall comply with the laws and regulations in force, in the State of the other Party during their stay in the territory of that Party.

## ARTICLE 6

The validity of the diplomatic or service / official passports of the nationals of either Party shall be to a minimum period of six (6) months from the time of entry into the territory of the other Party.

## ARTICLE 7

Each Party has the right to refuse entry or to shorten the duration of stay in its territory of any citizen of the other Party holding diplomatic or service/official passports, who are considered undesirable.

## ARTICLE 8

1- The Parties shall exchange through diplomatic channels, specimens of their valid diplomatic, service/official passports, mention in this Agreement, no later than thirty (30) days after the date of signature of this Agreement.

2- In case of introduction of new diplomatic or service/official passports or modification of the existing once, the Parties shall convey to each other, through diplomatic channels, specimens of such passports accompanied by detailed information on their applicability, not later than thirty (30) days prior to its application.

## ARTICLE 9

The Parties may suspend the application of this Agreement in whole or in part due to public order, national security or public health reason. The suspension shall be notified to the other Party at the earliest possible time through diplomatic channels.

## ARTICLE 10

Any dispute arising from the interpretation or implementation of this Agreement shall be settled amicably through consultation and negotiation between the Parties, through diplomatic channels.

## ARTICLE 11

1. This Agreement shall enter into force thirty (30) days from the date of the receipt of the second diplomatic note in which the Parties inform each other that the national legal requirements for the entry into force of this Agreement have been met.

2. This Agreement may be amended and supplemented in writing by mutual consent of the Parties, through diplomatic channels.

3. This Agreement shall remain in force for an indefinite period of time, unless either of the Parties, denounce it through diplomatic channels, the denunciation will be effective ninety (90) days after the date of the receipt of the last notification.

Done at Phnom Penh on 10th May 2022 in duplicate, in Khmer, Sinhala and English languages, all texts being equally authentic. In case of divergence in interpretation, the English text shall prevail.

IN WITNESS THEREOF, the undersigned being duly authorized by their respective Governments have signed this Agreement.

**FOR THE GOVERNMENT OF THE KINGDOM OF CAMBODIA**

**KOY KUONG**
**Secretary of State**
**Ministry of Foreign Affairs and International Cooperation**

**FOR THE GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**C. A. CHAMINDA I. COLONNE**
**Ambassador Extraordinary and Plenipotentiary to the Kingdom of Thailand**
**with accreditation to the Kingdom of Cambodia, the Lao People's Democratic Republic**
**& Permanent Representative to the Economic and Social Commission for Asia and the Pacific (UNESCAP)**

# កិច្ចព្រមព្រៀង
# រវាង
# រដ្ឋាភិបាល នៃព្រះរាជាណាចក្រកម្ពុជា
# និង
# រដ្ឋាភិបាល នៃសាធារណរដ្ឋសង្គមនិយមប្រជាធិបតេយ្យស្រីលង្កា
# ស្តីពី
# ការលើកលែងទិដ្ឋាការ សម្រាប់អ្នកកាន់លិខិតឆ្លងដែនការទូត និងផ្លូវការ

រដ្ឋាភិបាលនៃព្រះរាជាណាចក្រកម្ពុជា និង រដ្ឋាភិបាលនៃសាធារណរដ្ឋសង្គមនិយមប្រជាធិបតេយ្យស្រីលង្កា(ចាប់ពីពេលនេះតទៅហៅថា «ភាគី»)

ដោយមានបំណងពង្រឹងចំណងមិត្តភាព និងកិច្ចសហប្រតិបត្តិការរវាងប្រទេសទាំងពីរ

ដោយទទួលស្គាល់នូវភាពចាំបាច់ ក្នុងការសំរួលការធ្វើដំណើរចូលក្នុងទឹកដីនៃប្រទេសនីមួយៗ របស់ពលរដ្ឋនៃប្រទេសទាំងពីរ

បានព្រមព្រៀងដូចតទៅ៖

## មាត្រា ១

១. ពលរដ្ឋនៃភាគីនីមួយៗ ដែលកាន់លិខិតឆ្លងដែនការទូត ឬផ្លូវការ ដែលបានអនុញ្ញាតឲ្យចូល ឆ្លងកាត់ ស្នាក់នៅ និងចេញពីទឹកដីនៃរដ្ឋភាគីម្ខាងទៀត ដោយពុំចាំបាច់មានទិដ្ឋាការ សម្រាប់រយៈពេលមិនលើសពី ៣០ (សាមសិប) ថ្ងៃ គិតចាប់ពីថ្ងៃចូល។

២. ពលរដ្ឋនៃភាគីនីមួយៗ ដូចមានចែងក្នុងមាត្រា ១ នៃកិច្ចព្រមព្រៀងនេះ ដែលមានបំណងស្នាក់នៅលើសពី ៣០ (សាមសិប) ថ្ងៃ នៅលើទឹកដីនៃភាគីម្ខាងទៀត ត្រូវអនុវត្តតាមនីតិវិធីចាំបាច់នៃការស្នើសុំ ដោយអនុលោមតាមបទបញ្ញត្តិទាំងឡាយ របស់អាជ្ញាធរមានសមត្ថកិច្ច។

## មាត្រា ២

ក្នុងករណីពុំមានស្ថានបេសកកម្មការទូត ឬស្ថានកុងស៊ុលរបស់ភាគីណាមួយ អ្នកកាន់លិខិតឆ្លងដែនការទូត ឬផ្លូវការ ត្រូវដាក់ពាក្យស្នើសុំទៅនាយកដ្ឋានកុងស៊ុល នៃក្រសួងការបរទេសរបស់ភាគីម្ចាស់ផ្ទះ។

## មាត្រា ៣

ពលរដ្ឋនៃភាគីនីមួយៗ ដែលត្រូវបានតែងតាំងជាសមាជិកនៃស្ថានបេសកកម្មការទូត ឬស្ថានកុងស៊ុលប្រចាំនៅក្នុងទឹកដីនៃភាគីម្ខាងទៀត កាន់លិខិតឆ្លងដែនការទូត ដែលមានសុពលភាពនឹងមិនត្រូវបានអនុវត្ត

តាមលក្ខខណ្ឌនៃមាត្រា ១ នៃកិច្ចព្រមព្រៀងនេះ ។ បណ្ដាមន្ត្រីទាំងនេះ ព្រមទាំងក្រុមគ្រួសាររបស់ពួកគេនឹងត្រូវបានកំណត់ដោយអនុលោមទៅតាមច្បាប់ និងបទបញ្ញត្តិរបស់ភាគីនីមួយៗ ក្នុងការទទួលបានទិដ្ឋាការសមស្របពីស្ថានទូតនៃភាគីម្ខាងទៀត។

**មាត្រា ៤**

ពលរដ្ឋ ដូចបានកំណត់នៅក្នុងកិច្ចព្រមព្រៀងនេះអាចចូល ឆ្លងកាត់ ចេញពីទឹកដីនៃភាគីម្ខាងទៀតតាមគ្រប់ច្រកព្រំដែនអន្តរជាតិ ដែលបើកឲ្យធ្វើដំណើរ។

**មាត្រា ៥**

ពលរដ្ឋនៃភាគីម្ខាង ចាំបាច់ត្រូវគោរពច្បាប់ និងបទបញ្ញត្តិជាធរមានក្នុងកំឡុងពេលស្នាក់នៅក្នុងទឹកដីនៃរដ្ឋភាគីម្ខាងទៀត។

**មាត្រា ៦**

សុពលភាពលិខិតឆ្លងដែនការទូត ឬផ្លូវការរបស់ពលរដ្ឋនៃភាគីនីមួយៗ ត្រូវមានសុពលភាពយ៉ាងតិច ០៦ (ប្រាំមួយ) ខែ គិតចាប់ពីពេលចូលក្នុងទឹកដីរបស់ភាគីម្ខាងទៀត។

**មាត្រា ៧**

ភាគីនីមួយៗ មានសិទ្ធិក្នុងការបដិសេធការចូល ឬ កាត់បន្ថយរយៈពេលស្នាក់នៅក្នុងទឹកដីរបស់ខ្លួនចំពោះពលរដ្ឋភាគីម្ខាងទៀត ដែលកាន់លិខិតឆ្លងដែនការទូត ឬផ្លូវការ ដែលត្រូវបានចាត់ទុកថា ជាបុគ្គលមិនសមស្រប។

**មាត្រា ៨**

១. ភាគីទាំងពីរត្រូវធ្វើការផ្លាស់ប្ដូរគំរូលិខិតឆ្លងដែនការទូត និងផ្លូវការ ដែលមានសុពលភាព ដូចបានបញ្ជាក់នៅក្នុងកិច្ចព្រមព្រៀងនេះតាមផ្លូវការទូត ដោយមិនឲ្យលើសរយៈពេល ៣០ (សាមសិប) ថ្ងៃបន្ទាប់ពីការចុះហត្ថលេខាលើកិច្ចព្រមព្រៀងនេះ។

២. ក្នុងករណីមានការចេញប្រើប្រាស់លិខិតឆ្លងដែនការទូត ឬផ្លូវការថ្មី ឬក៏មានការកែប្រែលិខិតឆ្លងដែនចាស់ ភាគីទាំងពីរត្រូវបញ្ជូនឲ្យគ្នាទៅវិញទៅមកតាមផ្លូវការទូតនូវលិខិតឆ្លងដែនថ្មីនោះ ដោយភ្ជាប់ជាមួយនូវព័ត៌មានលំអិតនៃការប្រើប្រាស់ក្នុងរយៈពេល ៣០ (សាមសិប) ថ្ងៃ មុនពេលដាក់ឲ្យប្រើប្រាស់។

**មាត្រា ៩**

ភាគីនីមួយៗ អាចផ្អាកការអនុវត្តកិច្ចព្រមព្រៀងនេះទាំងស្រុង ឬផ្នែកណាមួយ ដោយមូលហេតុសណ្ដាប់ធ្នាប់សាធារណៈ សន្តិសុខជាតិ ឬសុខភាពសាធារណៈ។ ការផ្អាកនេះ នឹងត្រូវបានជូនដំណឹងទៅភាគីម្ខាងទៀតឲ្យបានឆាប់តាមផ្លូវការទូត។

## មាត្រា ១០

រាល់វិវាទដែលកើតចេញពីការបកស្រាយ ឬការអនុវត្តកិច្ចព្រមព្រៀងនេះ ត្រូវដោះស្រាយដោយភាតរភាព តាមរយៈការពិគ្រោះយោបល់ និងការចរចារវាងភាគីទាំងពីរ តាមរយៈផ្លូវការទូត។

## មាត្រា ១១

១. កិច្ចព្រមព្រៀងនេះ នឹងចូលជាធរមានក្នុងរយៈពេល ៣០ (សាមសិប) ថ្ងៃ ចាប់ពីការទទួលបានកំណត់ទូតលើកទីពីរ ដែលភាគីទាំងពីរ បានជូនព័ត៌មានគ្នាទៅវិញទៅមក អំពីការបំពេញចប់សព្វគ្រប់នីតិវិធីផ្ទៃក្នុង សម្រាប់ការចូលជាធរមាននៃកិច្ចព្រមព្រៀងនេះ។

២. កិច្ចព្រមព្រៀងនេះអាចធ្វើវិសោធនកម្ម និងបំពេញបន្ថែម ដោយភាគីទាំងពីរតាមរយៈការព្រមព្រៀងគ្នាជាលាយលក្ខណ៍អក្សរតាមផ្លូវការទូត។

៣. កិច្ចព្រមព្រៀងនេះនឹងនៅជាធរមានមិនកំណត់ លុះត្រាតែភាគីណាមួយ បានជូនព័ត៌មានអំពីការបញ្ចប់តាមផ្លូវការទូត។ ការបញ្ចប់នឹងមានប្រសិទ្ធភាព ៩០ (កៅសិប)ថ្ងៃ បន្ទាប់ពីថ្ងៃទទួលបានការជូនព័ត៌មានចុងក្រោយ។

ធ្វើនៅរាជធានីភ្នំពេញ ថ្ងៃទី១០ ខែ ឧសភា ឆ្នាំ ២០២២ ជាពីរច្បាប់ដើម ជាភាសាខ្មែរ ភាសាស្រីលង្កា និងភាសាអង់គ្លេស ដែលអត្ថបទទាំងអស់មានតម្លៃស្មើៗគ្នា។ ក្នុងករណីមានការបកស្រាយផ្សេងគ្នា អត្ថបទជាភាសាអង់គ្លេសត្រូវយកជាឯកសារគោល។

ដើម្បីជាសក្ខីភាព ហត្ថលេខីខាងក្រោមនេះ ដែលទទួលបានការអនុញ្ញាតត្រឹមត្រូវពីរដ្ឋាភិបាលនីមួយៗ ឲ្យចុះហត្ថលេខាលើកិច្ចព្រមព្រៀងនេះ។

**ជ.រដ្ឋាភិបាល**
**នៃព្រះរាជាណាចក្រកម្ពុជា**

**កុយ គួង**
**រដ្ឋលេខាធិការ**
**ក្រសួងការបរទេស និង**
**សហប្រតិបត្តិការអន្តរជាតិ**

**ជ.រដ្ឋាភិបាល**
**នៃសាធារណរដ្ឋសង្គមនិយម**
**ប្រជាធិបតេយ្យស្រីលង្កា**

**ស៊ី.អេ.ចាមីនដា អាយ. កូឡូន**
**ឯកអគ្គរដ្ឋទូតវិសាមញ្ញ និងពេញសមត្ថភាព**
**ប្រចាំព្រះរាជាណាចក្រថៃឡង់ដ៍ ព្រមទាំង**
**ប្រចាំនៅព្រះរាជាណាចក្រកម្ពុជា និង**
**សាធារណរដ្ឋប្រជាធិបតេយ្យប្រជាមានិតឡាវ និងជាតំណាងអចិន្ត្រៃយ៍ប្រចាំគណៈ**
**កម្មាការសង្គម សេដ្ឋកិច្ចសំរាប់អាស៊ី និង**
**ប៉ាស៊ីហ្វិក**

# කාම්බෝජියා රාජධානියේ රජය

# සහ

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය

# අතර

# රාජ්‍යතාන්ත්‍රික සහ  සේවා/නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන්

# වීසා බලපත්‍ර ලබා ගැනීමෙන්

# නිදහස් කිරීම පිළිබඳ ගිවිසුම

මෙහි, මින්මතු "පාර්ශ්ව" ලෙස හඳුන්වනු ලබන, කාම්බෝජියා රාජධානියේ රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය ;

දෙරට අතර මිත්‍රශීලී සබඳතා සහ සහයෝගිතාව ශක්තිමත් කිරීමේ අභිලාෂයෙන්;

දෙරටේ පුරවැසියන්, අනෙක් රටේ දේශයට සිදුකරන සංචාර සඳහා පහසුකම් සැලසීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින්;

මෙසේ ගිවිස ගනිති:

## 1 වැනි වගන්තිය

1. රාජ්‍යතාන්ත්‍රික සහ සේවා/නිල විදේශ ගමන් බලපත්‍ර හිමි කුමන හෝ පාර්ශ්වයක පුරවැසියන්, අනෙක් පාර්ශ්ව රාජ්‍යයට ප්‍රවේශ වන දිනයේ සිට දින තිහක (30) කාලසීමාවක් සඳහා වීසා බලපත් නොමැතිව එම පාර්ශ්වයේ දේශයට ඇතුළුවීම, එහි සංක්‍රාන්තියේ යෙදීම, නැවතී සිටීම සහ ඉන් පිටවී යාම සිදුකළ හැකිය.

2. අනෙක් පාර්ශ්වයේ දේශය තුළ දින තිහ (30) කට වැඩි කාලසීමාවක් මුළුල්ලේ නැවතී සිටීමට අපේක්ෂා කරන, මෙම ගිවිසුමේ පළමුවැනි වගන්තියේ දක්වා ඇති කුමන හෝ පාර්ශ්වයක පුරවැසියන්, අනෙක් පාර්ශ්වයේ ශක්නුවත් බලධාරීන්ගේ අදාළ රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය වන්නා වූ ලියාපදිංචි කිරීමේ ක්‍රියා මාර්ගයට පිවිසිය යුතුය.

## 2 වැනි වගන්තිය

පාර්ශ්වවල රාජ්‍යතාන්ත්‍රික දූතමණ්ඩලයක් හෝ කොන්සියුලර් කාර්යාලයක් හෝ පිහිටා නොමැති අවස්ථාවල දී රාජ්‍යතාන්ත්‍රික හෝ සේවා/නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන්, සත්කාරක රටේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් දෙපාර්තමේන්තුව ඇමතිය යුතුය.

## 3 වැනි වගන්තිය

අනෙක් පාර්ශ්ව දේශය සඳහා අක්ත ගන්වන ලද රාජ්‍යතාන්ත්‍රික හෝ කොන්සියුලර් කාර්යාලයක සාමාජිකයින් වශයෙන් පත් කොට ඇති, වලංගු රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රයක් හිමි එක් එක් පාර්ශ්වයේ ජාතිකයින් මෙම ගිවිසුමේ 1 වගන්තිය ප්‍රකාරව ප්‍රවේශ වීමට හිමිකම් නොලැබිය යුතුය. එවැනි නිලධාරීන්ට සහ ඔවුන්ගේ පවුල්වලට, පාර්ශ්වවල අදාළ නීති හා රෙගුලාසි ප්‍රකාරව, අනෙක් පාර්ශ්වයේ තානාපති කාර්යාලයෙන් යෝග්‍ය වීසා බලපත්‍ර ලබා ගැනීම කළ යුතුය.

## 4 වැනි වගන්තිය

මෙම ගිවිසුමේ සඳහන් කොට ඇති පුරවැසියන්ට, ජාත්‍යන්තර මඟී ගමනාගමනය සඳහා විවෘතව පවත්නා දේශසීමා තරණය කිරීමේ ස්ථාන සියල්ලම හරහා අනෙක් පාර්ශ්ව රාජ්‍යයේ දේශයට ප්‍රවේශ වීම, එහි සංක්‍රාන්තියේ යෙදීම හා ඉන් පිටවීම කළ හැකිය.

## 5 වැනි වගන්තිය

කුමන හෝ පාර්ශ්වයක පුරවැසියන් අනෙක් පාර්ශ්ව දේශයේ නැවතී සිටින කාලසීමාව තුළ දී එම පාර්ශව රාජ්‍යයේ බලපැවැත්වෙන නීති හා රෙගුලාසි පිළිපැදිය යුතුය.

## 6 වැනි වගන්තිය

කුමන හෝ පාර්ශ්වයක ජාතිකයන්ගේ රාජ්‍යතාන්ත්‍රික හෝ සේවා/නිල විදේශ ගමන් බලපත්‍රවල වලංගුභාවය, අනෙක් පාර්ශ්ව දේශයට ඇතුළු වූ මොහොතේ සිට මාස හය (6) ක අවම කාලසීමාවක් සඳහා පැවතිය යුතුය.

## 7 වැනි වගන්තිය

යෝග්‍ය නොවේයැයි සලකනු ලබන යම් රාජ්‍යතාන්ත්‍රික හෝ සේවා/නිල විදේශ ගමන් බලපත්‍ර හිමි අනෙක් පාර්ශ්වයේ පුරවැසියෙකු තම දේශයේ රැඳී සිටීම ප්‍රතික්ෂේප කිරීමට හෝ රැඳී සිටින කාලසීමාව කෙටි කිරීමට එක් එක් පාර්ශවයට හිමිකම ඇත.

## 8 වැනි වගන්තිය

1. මෙම පාර්ශ්ව, මෙම ගිවිසුමට අත්සන් තැබූ දිනට පසුව එළඹෙන දින තිහ (30) නොඉක්මවන කාලයක් තුළ, මෙම ගිවිසුමේ සඳහන් කොට ඇති වලංගු රාජ්‍යතාන්ත්‍රික හෝ සේවා/නිල විදේශ ගමන් බලපත්‍රවල ආදර්ශයන් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ හුවමාරු කළ යුතුය.

2. නව රාජ්‍යතාන්ත්‍රික හෝ සේවා/නිල විදේශ ගමන් බලපත්‍ර හඳුන්වා දෙන අවස්ථාවක දී හෝ දැනට පවත්නා විදේශ ගමන් බලපත්‍රවල යම් වෙනස්කමක් කළ අවස්ථාවක දී, පාර්ශ්ව, එය අදාළ කර ගැනීමට පෙර දින තිහ (30) ක් නොඉක්මවමින්, ඒවායේ අදාළ කරගැනීම පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් එම විදේශ ගමන් බලපත්‍රවල ආදර්ශයන් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ එක් එක් පාර්ශ්ව වෙත දැනුම් දිය යුතුය.

## 9 වැනි වගන්තිය

පාර්ශ්ව වලට මහජන සාමය, ජාතික ආරක්ෂාව හෝ මහජන සෞඛ්‍යය යන හේතූන් මත මෙම ගිවිසුම පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ අදාළ කර ගැනීම අත්හිටුවිය හැකිය. මෙම අත්හිටුවීම රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ හැකි ඉක්මනින් අනෙක් පාර්ශ්වයට දැනුම් දිය යුතුය.

## 10 වැනි වගන්තිය

මෙම ගිවිසුම අර්ථකථනයේ දී හෝ ක්‍රියාවට නැංවීමේ දී පැනනඟින ඕනෑම ආරවුලක් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ පාර්ශව අතර සිදු කරනු ලබන උපදේශන හා සාකච්ඡා තුළින් සාමකාමීව විසඳාගත යුතුය.

## 11 වැනි වගන්තිය

1. මෙම ගිවිසුම, බලාත්මක වීම සඳහා අවශ්‍යවන දේශීය නීතිකරණය සකසා අවසන් බව එක් එක් පාර්ශ්වයට දැනුම් දීමේ දෙවැනි රාජ්‍යතාන්ත්‍රික සටහන ලැබූ දින සිට තිස්වන (30) දිනයේ දී බලාත්මක විය යුතුය.

2. රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ පාර්ශ්වවල අන්‍යෝන්‍ය ලිඛිත එකඟතාව මඟින් මෙම ගිවිසුම සංශෝධනය හා ඌණ පූරණය කළ හැකිය.

3. කුමන හෝ පාර්ශ්වයක් මෙම ගිවිසුම අවසාන කරන බව රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ ප්‍රකාශ නොකරන්නේ නම්, මෙම ගිවිසුම අවිනිශ්චිත වූ කාලසීමාවක් සඳහා බලපැවැත්විය යුතුය. මෙසේ මෙම ගිවිසුම අවසන් කරන බව ප්‍රකාශ කිරීමේ අවසාන නිවේදනය ලැබි දින 90 කට පසුව මෙම අවසාන වීම බලාත්මක වනු ඇත.

ඛමර් , සිංහල හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් සියලුම පාඨ සමානව සත්‍යවත් වන ආකාරයෙන් සකසා, **නොම් පෙන් , කාම්බෝජියා** හි දී ........................................... වැනි දින අත්සන් තබන ලදී. අර්ථකථනයේ දී යම් අපසාරීතාවක් වෙතොත්, මෙහි ඉංග්‍රීසි පිටපත වලංගුව පැවතිය යුතුය.

මීට සාක්ෂි පිණිස, අදාළ රජයයන් විසින් නිසි පරිදි බලය පවරන ලද පහත අත්සන් තබන අය විසින් මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

**කාම්බෝජියා රාජධානියේ රජය වෙනුවට**

**කොයි කුවොංග්**

විදේශ කටයුතු සහ ජාත්‍යන්තර සහයෝගිතා අමාත්‍යාංශයේ ලේකම්

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය වෙනුවට**

**සී.ඒ. චාමින්දා අයි. කොලොන්නෙ**

කාම්බෝජ රාජධානිය හා ලාවෝ මහජන ප්‍රජාතාන්ත්‍රික ජනරජය සඳහා අක්තගන්වන ලද තායිලන්ත රාජධානිය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ හා පූර්ණ බලැති තානාපති සහ එක්සත් ජාතීන්ගේ ආසියාව සහ පැසිෆික් සඳහා ආර්ථික හා සමාජ කොමිෂන් සභාවේ (UNESCAP) නිත්‍ය නියෝජිත